# අපේක්ෂම සොයා  යන ලිපියට ඌන පූරණයක්

පසුගිය සන්නස ජූනි කලාපයේ පලවූ අපේක්ෂම සොයා  මැයෙන් පලවූ මේණකා ජයතිලක සොයුරිය ගේ ලිපිය කියවූ විට ඒ පිලිබඳ මගේ අදහස් ලියා එවන්නට සිත් වුන්නා. එම ලිපියේ පලවූ බොහෙ-ාමයක් අදහස් සමග එකඟ වන අතරම මෑතකදී  මා මුහුණ දුන් සිද්ධියක්ද සිහියට නැගුනා.

ලඟදී දිනක යාන්තමට කථාකරන වයසේ දරුවකුද රැගත් ලඟදී ඔස්ට්‍රේලියාවට පැමිණි බව අනුමාන කල හැකිවූ යුවලක් වූල්වර්ත් සාප්පු සංකීර්ණයේදී ඇස් ගැටුණා. දුරදී සිංහලයෙන් තම දරුවා සමග කථා කරමින් පැමිනි මෙම යුවල මා දුටු වහාම දරුවාට ඉංග්‍රීසියෙන් අමතන්නට වුනා. ඉංග්‍රීසි භාෂාව නුහුරු මෙම දරුවා අන්දමන්දව තම දෙමව්පියන් දෙස බලනු දුටු මට උපහාසයට වඩා ඇතිවුනේ අනුකම්පාවක්.

මේ රටේ ජීවත්වන තුන්වන හතරවන පරම්පරාවේ ඉතාලි සහ ග්‍රීක දරුවෝ තම මවු භාෂාව නොපැකිල කථාකරන මුත් සිංහල අපට සිදුවී ඇත්තේ කුමක්දැයි සිංහල ලැදි අයට මහත් ප්‍රහෙලිකාවක් බව අමුතුවෙන් කිවයුතු නොවේ. මේ පිලිබඳව කොතරම් ලිපි පලකලද ඇතිවන ප්‍රගතියක් නැත. ලඟදී ඉරිදා දිවයින පුවත් පතේ පලවූ ලිපියකින් සිංහළ අපට සිදුවෙමින් ඇත්තේ කිමෙක්දැයි, ද්‍රවිඩ, මුස්ලිම් සහ සිංහළ මඟුල් ගෙවල් අලලා කල සංසන්ධනාත්මක අගැයීමක් කර තිබුණි. එහි හරය නම් සිංහළ අපි යටි සිතින් අපේ සංස්කෘතිය පහත් ලෙස සලකන බවයි. මෙය වසර හාර-සිය ගනනක් තිස්සේ යටත් විජිතයක් ලෙස පැවතීමෙන් ලද හීනමානයත්, අන් රටවල මෙන් එම හීනමානය දුරුකල හැකි නායකත්වයකට වඩා බටහිර ගැති නායකත්වයක් යටතේ නිදහස ලද පසුවද ජීවත්වීම යයි මට සිතේ. නිදහසින් පසු අපට හිමිවූ නායකත්වය පිලිබඳ අනර්ගවූ විග්‍රහයක් වික්ටර් අයිවන්ගේ දේශපාලන පවුල්පොරය යන පොතෙහි දක්වා ඇත. කෙසේ වෙතත් මගේ ලිපියේ මූලික අදහස මේ පිලිබඳ දිගින් දිගටම අදහස් දැක්වීමට වඩා සිංහළ අප පිටරට දී හැසිරෙන අයුරු වෙනත් දෘෂ්ටි කෝණයකින්  දැකීමයි. සිංහළයකු තවත් සිංහළයකු දුටුවිට හැසි-රෙන විලාශයට හීනමානය නිසා හිත උදුම්මාගැනීමට අමතරව වෙනත් හේතුවක් ඇද්ද ?

මගේ සහ සමහර මිතුරන් ගේ අත්දැකීම් අනුව නන්නාඳුනන සිංහළයන්ට උදව් කිරීමට ගොස් අතපුච්චා ගත් අවස්ථා සඳහා උදහරණ එමට ඇත. මෙහිදී සිදුවන දුක්බරම අවස්ථාව වන්නේ සිංහළයන් සිංහළයන්ටම වලකපන බව දකින වෙනත් ජාතිකයන්ගේ කටුක වදන් අසා සිටීමය.  මේ සඳහා සත්‍යවූ උදාහරණ කීපයක් හෙලි කිරීමට මට ඉඩදෙන්න.

මා ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ වකවානුව මගේ වෘත්තීය සඳහා රැකියාවන් විරල වූ සමයක් විය.  එක්තරා රැකියාවක් සඳහා ඉල්ලුම් පත්‍රයක් යොමුකල මට සම්මුඛ පරීක්ෂණයකට ඇරයුම් ලැබුන අතර අනතුරුව රැකියාවට මා තෝරාගත් බව දන්වන ලදී. අලුත් රැකියාව පිලිගත් මම පරණ රැකියාවෙ-න් ඉල්ලා අස්ව දින කීපයක් නිවාඩු ලබා

විජයසිරි තිලකුමාර

බ්‍රිස්බේන්

ගත්තෙමි. එම නිවාඩු කාලය තුල, ලංකාවේ මා රැකියාව කල ආයතනයේම මට වඩා ඉහල ශ්‍රේණියක රැකියාව කල, ඒ' වනවිටත් රැකියා-වක් නැතිව සිටි තැනැත්තකු හමුවීමට ගිය මම සතුටු සාමීචි කථා වලින් පසුව මට ලැබුන අලුත් රැකියාව ගැනත් ඔහුට කීවෙමි. ඒ' පිලිබඳව වචනයකදු ඔහු නොතෙපලුවද ඔහුගේ අසාමාන්‍ය හැසිරීම  ගැන සිතීමට තරම් මම උනන්දු නොවීමි. පසුව රැකියාවට වාර්තා කර දින කීපයකින් මා කැඳවූ කළමනාකරු ඔහු ලද  ලිපියක් මට පෙන්වීය. පුදුමයකට මෙන් එම ලිපිය ලියා තිබුනේ ඉහත කී තැනැත්තාය. ඔහුද එම රැකියාව සඳහා සම්මුඛ පරීක්ෂණයට පැමිණායද ඔහුට රැකියාව නොදීම ගැන ඔහු උරන වී ඇති සැටියක් ලිපියේ දැක්වින. ඔහුගේ මූලිකම තර්කය වී තිබුනේ ලංකාවේ එකම ආයතණයේ මට වඩා ඉහල ශ්‍රේණියක සිටීම ඔහුට රැකියාව දීමට සුදුසුකම බවය. මා සමග කථාකල අවස්ථාවේ ඔහු  එම රැකියාව සඳහා සම්මුඛ පරීක්ෂණයට ගිය බව වත්  සඳහන් නොකල මෙම පුද්ගලයා පසුව මට විරුද්ධව දන්වා සිටීම මට මහා කලකිරීමකට හේතු විය. එහෙත් මා සැනසුනේ කළමනාකරු ඔහුගේ පිලිතුරු ලිපියද මට පෙන්වූ අවස්ථාවේදීය. එම ලිපියේ ඔහුට රැකියාව නොදීමට හේතුව අවෂ්‍ය අධ්‍යාපණ සුදුසු කම් වල අඩුව නොව එම රැකියාවට අවෂ්‍යම වු සන්නිවේදනය සඳහා ඔහු තුල තිබූ දුර්වල කම බව සඳහන් කර තිබුණි. එම රැකියාව සඳහා ඉල්ලුම් පත්‍ර 18 ලැබී තිබුන අතර එයින් 15 දෙනෙකුම ශ්‍රී ලාංකිකයන් විය. 5 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවා තිබූ අතර ඉන් 4 දෙනෙකුම ශ්‍රී ලාංකිකයන් විය. තමනට තනතුර නොලැබීම ගැන උරන වී ඉල්ලුම් පත්‍ර එවූ පුද්ගලයන් 18 දෙනාගෙන් දෙදෙනකු ලිපි එවා තිබුන අතර එම දෙදෙනාම ශ්‍රී ලාංකිකයන් විය. පසුව කළමනාකරු මට කියා සිටියේ ඔහු දකුණු ආසියාවේ බොහෝ කලක් සේවය කර ඇති බවත් එහිදී ඔහු දුටුව ප්‍රධානම දෙයක් නම් දකුණු ආසියාවේ බොහෝ දෙනෙක් එකි-නෙකා ගේ බෙලි කපා ගැනීමට දක්ෂ බවත්ය. ඔහුගේ එම ප්‍රකාශය මට අතිශයින්ම වේදනාකාරී අත්දැකීමක් විය.

දෙවන උදාහරණය මගේ මිතුරකු එංගලන්තයේදී ලද අත්දැකීමකි. මේ මිතුරා ලන්ඩන් නුවර එක්තරා ආයතනයක රැකියාව කල වකවානුවක, රැකියා විරහිතව සිට සිංහළයකුට එම ආයතණයේම රැකියාවක් ලබාගැනීමට උදව්කර ඇත. ටික කලකට පසුව මගේ මිතුරාගේ හැකියාවන් ගැන පැහැදුන ආයතනයේ කළමනාකරු මිතුරාව උප කළමනාකරු තනතුරකට නම්කර ඇත. දින කීපයකට පසු මිතුරාට කථාකල කළමනාකරු පවසා ඇත්තේ, මගේ මිතුරාගේ උදව්වෙන් රැකියාව ලද ඉහත කී සිංහළයා කළමනාකරු හමුව මිතුරාට උප කළමනාකර තනතුර නොදෙන ලෙස ගතු කියූ බවය. වඩාත්ම සංවේගජනක සිදුවීම නම් මේ බෙලි කැපීමේ පුරුද්ද සිංහළයන් අතර මුල් බැසගත් තත්වයක් ලෙස කළමනාකරුට හැඟෙන බව ඔහු පවසා සිටීම බව මිතුරා පවසයි. ඉහත කී මිතුරා දැනට ඔස්ට්‍රේලියාවේ පදිංචි කරුවකු වන අතර සිංහළයකු මිතුරකු ලෙස ඇසුරු කිරීමට ඉතා මැලිවන අතර කිසිම සිංහළයකුට රැකියාවක් ලබාගැනීම සඳහා උදව් කිරීමට නොපැකිලේ.

මෙවැනි සිදුවීම් ගැන සාකච්චා සිංහළ අප අප අතර සිදුවෙන බොහෝවිට අප සිත් සදා ගනුයේ මෙය කිසියම් ජාතියකට ආවේනික




ලක්ෂණයක් නොව එක් එක් පුද්ගලයාගේ හැදියාව මත රඳාපවතින බව තීරණය කිරීමෙනි. මෙය අධි ජාත්‍යාලයෙන් මිදී මධ්‍යස්ථව තීරණය කලයුත්තකැයි මට සිතේ.

ඉහත කී අත්දැකීම් වලට සමාන අත්දැකීම් පාඨක ඔබටද ඇති බවට සැකයක් නැත. මෙවැනි අත්දැකීම් අසාමාන්‍ය සිද්ධීන් බවත් ඒ'වා උදාහරණ ලෙස ගෙන මෙය සිංහළයන්ට පොදුවූ ලක්ෂණයක් ලෙස තීරණයකට ඒම අසාධාරණ බව කෙනෙකුට තර්ක කල හැක. එහෙත් පුද්ගල හැදියාව ඇත්තේ එම පුද්ගලයා අයති සමාජ සංස්කෘතික සත්තාවටම  හෙයින්, මෙවැනි සිද්ධීන් අහඹු සිදුවීම්ද නැතහොත් සිංහළ සමාජ සංස්කෘතික ප්‍රවාහයට අයත් අපේ සාරධර්ම වල පිරිහීමක හෝ අඩු ලුහුඬු  කමක ප්‍රතිඵලයක් දැයි විමසීම නොවටීද ?

මේ සඳහා සංස්කෘතිය යන්න 1871 දී එඩ්වර්ඩ් බර්නෙට් ටේලර් නිර්වචණයකර ඇති අකාරය විමසා බැලීම වටී.  සංස්කෘතිය යනු සමාජමය පැවැත්ම තුලින් මිනිසා උකහාගන්නා සංකීර්ණවූ අත් දැකීම් සහ දැනුම වේ. මෙම දැනුම තුල එම සමාජයේ පවතින විශ්වාසයන්, කලාව, සාරධර්ම, නීතිය, සිරිත් විරිත්, සහ වෙනත් පුරුදු අන්තර්ගත වේ.  මෙම නිර්වචණයේ ඇති පුරුදු යන්නට ඉහත කී බෙලි කපා ගැනීමද අයත් නම් එය සිංහළ සංස්කෘතියට ආවේණික ලක්ෂණයක් වී ඇත්දැයි බියක් ඔබට නොදැනේද ?




# Stockdale&Leggo

**Buying or selling your home?**

Whether you are a first home buyer, experienced investor or upsizing your home, my mission is to provide a personal and professional service to you, For all your real estate needs please call me for free and friendly advice.



"I care about making a difference. My clients are trusting me to help them with one of the biggest decisions they'll make in their lifetime and that is something I take very seriously!"

Sugath Warnasuriya
0422 577 353

**Stockdale & Leggo,**
Shop 36, The Stables Shopping Centre,
Childs Road Mill Park

**LATROBE TAXATION SERVICES**

14 DAY TAX REFUNDS

# 14 DAY TAX REFUNDS

**INDIVIDUAL RETURNS**
**$65**

**BAS/IAS and BUSINESS TAX RETURNS**

**LATROBE TAXATION SERVICES**
**Registered Tax Agent and Accountant**

**Contact**
**Mala: 94708241 or 0401000421**
**Email: latrobetax@yahoo.com.au**